# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2115/10 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 මාර්තු මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මාර්තු මස 16 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (3) ''ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (3) ශීර්ෂය, ''ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි I අයිතමය -

1. ''ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;


1A - G 29697 — 392 (2019/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(ඇ) එහි I වැනි තීරුවෙහි 22 සිට 25 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 21 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 14 සිට 24 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)

(2) එම නිවේදනයෙහි අංක (31) ''සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 10 සහ 11 අයිතමයන් ඉවත් කිරීමෙන් ;
(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 9 සිට නැවත අංකගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි I අයිතමය ඉවත් කිරීමෙන් ;
(ඈ) එහි II වැනි තීරුවෙහි අයිතම 2 සිට නැවත අංකගත කිරීමෙන් ;

(3) එම නිවේදනයෙහි අංක (13) ''කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (13) ශීර්ෂය, ''කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි I අයිතමය -

1. ''කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන විෂයයට හා II වැනි තීරුවෙහි දක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි 10 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

11. දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමට අදාළ කටයුතු
12. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
13. රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
14. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
15. වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
16. විදේශයන්හි ශ්‍රී ලංකා වෙළඳ කටයුතු නියෝජනය කිරීම
17. වෙළඳ ප්‍රදර්ශණ පැවැත්වීම
18. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා එක්ව ජාත්‍යන්තර වෙළඳ සබඳතා සම්බන්ධ කටයුතු සිදු කිරීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 18 සිට නැවත අංකගත කිරීමෙන් ;

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(ඉ) එහි II වැනි තීරුවෙහි 31 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

32. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
33. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
34. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය
35. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
36. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
37. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
38. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
39. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
40. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
41. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
42. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
43. වාණිජ දෙපාර්තමේන්තුව

(ඊ) එහි III වැනි තීරුවෙහි ''රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33) ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)

04 - 95

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.